## 2024-02-26 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නැවත පණ ගැන්වීම සඳහා ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

පවතින ආර්ථික පසුබෑමේ ප්‍රතිඵලයක් වශයෙන් සහ සිය පාලනයෙන් තොර බාහිර සාධකවල බලපෑම් හේතුවෙන් නිෂ්පාදන, ආනයන, අපනයන, සංචාරක, ඇඟළුම් සහ වෙනත් විවිධ වාණිජ මෙහෙයුම් ආශ්‍රිත ව්‍යාපාරික කටයුතුවල යෙදෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සැලකිය යුතු පිරිසකට සිය ව්‍යවසායයන් තවදුරටත් පවත්වාගෙන යාම ඉතා දුෂ්කර වී ඇත. ඒ සඳහා සහනයක් වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා කාරක ප්‍රාග්ධන සහාය ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟතාව පළ කර තිබේ. යෝජිත වැඩසටහන මඟින් දැනට ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට ඔවුන්ගේ ව්‍යාපාර තවදුරටත් පුළුල් කර ගැනීමට සහ ප්‍රකෘතිමත් කර ගැනීමට අවශ්‍ය ණය පහසුකම් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු හරහා සහනදායී පොලී අනුපාත ලබා දීමට අපේක්ෂා කරනු ලබයි. සංරචක දෙකකින් යුතු එකී ව්‍යාපෘතිය සඳහා රුපියල් බිලියන 20ක් යෙදවීමට නියමිත අතර, ඉන් රුපියල් බිලියන 15ක් දැනට පවත්වාගෙන යනු ලබන සහ නව ව්‍යවසායයන් ශක්තිමත් කිරීමටත්, ඉතිරි රුපියල් බිලියන 05ක මුදල අක්‍රිය ණය කාණ්ඩය යටතේ පවතින ව්‍යවසායයන්ට සහාය වීමටත් යොදවනු ඇත. ඒ අනුව, යෝජිත ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 02. ජාතික සංචාරක ප්‍රතිපත්තිය

ජාතික සංචාරක ප්‍රතිපත්තිය කෙටුම්පත 2023-09-04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ගනු ලැබූ අතර, එහිදී සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් තවදුරටත් එකී කෙටුම්පත සමාලෝචනය කළ යුතු බවට තීරණය කරන ලදී. ඒ අනුව, ජනාධිපති ලේකම් විසින් පත් කරනු ලැබ ඇති කමිටුවක් විසින් සංචාරක කර්මාන්තයේ ගැටලු හා විභවයන් හඳුනාගනිමින් සහ දේශීය හා ගෝලීය



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன வெனியு, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු ෙදු T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

සන්දර්භයන් සැලකිල්ලට ගනිමින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ට අනුගතව යෝජිත ජාතික සංචාරක ප්‍රතිපත්තිය කෙටුම්පත් කරනු ලැබ ඇත. එකී ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**03. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි හා කොළඹ වරායෙහි සෞඛ්‍ය ධාරිතාවන් වැඩිදියුණු කිරීම**

ජාත්‍යන්තර සංචාරක කටයුතු හා ව්‍යාපාරික සංචාරවලින් උපයන ආදායම මත ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රධාන වශයෙන් රැඳී ඇති බැවින් බාධාවකින් තොරව රට තුළට ඇතුළු වීමේ ස්ථාන ක්‍රියාත්මක කිරීම, සංචාරකයින් තුළ විශ්වාසය ගොඩනැංවීම සහ සංචරණය සම්බන්ධයෙන් ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි සමඟ අනුකූල වන පරිදි දේශසීමා මායිම් හරහා ඇතුළු වීමේ ස්ථාන පිළියෙල කිරීමේ අවශ්‍යතාව හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, ඇතුළුවීමේ ස්ථානවල දේශසීමා ආශ්‍රිත සෞඛ්‍ය පෙර සූදානම, ආසාදිත රෝග පාලනය සඳහා සෘජුව දායක වීම සහ විවිධ හදිසි සෞඛ්‍ය අවස්ථාවන්හිදී සියලුම මගීන්ගේ, කාර්යමණ්ඩලයේ හා ඇතුළුවීමේ ස්ථානවල කාර්යමණ්ඩලවල සුරක්ෂිතතාවය සමස්තයක් ලෙස වැඩිදුරටත් ශක්තිමත් කිරීම සඳහා ජපාන රජය විසින් සංක්‍රමණිකයන් සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) හරහා ජපාන යෙන් මිලියන 1,170ක ප්‍රදානයක් ලබා දී තිබේ. එම ප්‍රදානය යටතේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, කොළඹ වරාය සහ මාලදිවයිනේ ජාත්‍යන්තර ගුවන්තොටුපොළවල පහසුකම් ජාත්‍යන්තර පරිචයන්ට, නිර්දේශයන්ට හා ප්‍රමිතීන්ට අනුව වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධීකරණයෙන් යුතුව අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සහයෝගීතාව සඳහා ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර පවත්නා අවබෝධතා ගිවිසුම යටතේ 2024-2026 කාලසීමාව සඳහා ක්‍රියාකාරී සැලැස්ම අත්සන් කිරීම**

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සහයෝගීතාව සඳහා ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර 2006-11-27 දින අවබෝධතා ගිවිසුමකට අත්සන් තබා ඇත. එම අවබෝධතා ගිවිසුමේ විධිවිධාන පරිදි දෙපාර්ශ්වයේ එකඟතාව මත කෘෂිකාර්මික ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා 2010-2011, 2017-2019 හා 2022-2024 කාලසීමාවන්ට අදාළව ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාවට නංවා ඇති අතර 2024-2026 කාලසීමාව සඳහා නව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරනු ලැබ තිබේ. වියට්නාම සමාජවාදී ජනරජයේ කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ ජාත්‍යන්තර සහයෝගීතා දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලය විසින් එකී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඒ අනුව, එකී ක්‍රියාකාරී සැලැස්මට දෙපාර්ශ්වය අතර අත්සන් තැබීම පිණිස කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. බත්තරමුල්ල වෝටර්ස් එජ් පරිශ්‍ර භූමියෙහි පිහිටි ඉඩම් කොටස් දෙකක් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත හා කොළඹ - 10, අශෝක විද්‍යාලය වෙත බද්ද පදනමින් බැහැර කිරීම**

බත්තරමුල්ල වෝටර්ස් එජ් පරිශ්‍ර භූමියෙහි පිහිටි රූඩ් 2 පර්චස් 30.89ක ඉඩම් කොටසක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ බෝට්ටු පැදීම සහ දිවි ගලවා ගැනීමේ කඳවුරු පුහුණු කිරීම සඳහා නාවික හමුදාව වෙතත්, අක්කර 4 රූඩ් 2 පර්චස් 1.60ක ඉඩම් කොටසක් ක්‍රීඩා පිටියක් ලෙස පරිහරණය කිරීම සඳහා කොළඹ - 10, අශෝක විද්‍යාලය වෙතත් ඉඩම් කොමසාරිස් ජනරාල් මඟින් දීර්ඝකාලීන බද්ද පදනම මත ලබා දීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. 1956 අංක 11 දරන රබර් පාලන පනත සංශෝධනය කිරීම**

2022-06-06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, 1956 අංක 11 දරන රබර් පාලන පනත සංශෝධනය කිරීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් රබර් පාලන (සංශෝධන) පනත්

කෙටුම්පත සකස් කරනු ලැබ ඇති අතර, ඒ සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 07. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත කෙටුම්පත් කිරීම

නව මූල්‍ය රීති රාමුවක් කෙටුම්පත් කිරීමට සහ යෝජිත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට එකී මූල්‍ය රීති රාමුව ඇතුළත් කිරීමට 2023-05-08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරුන් දෙදෙනෙකුගේ සම-සභාපතිත්වය යටතේ පත් කරන ලද අධීක්ෂණ කමිටුවක උපදේශකත්ව සහ ප්‍රතිපත්තිමය මග පෙන්වීම යටතේ මූලික කෙටුම්පතක් සකස් කරනු ලැබ ඇත. එකී මූලික කෙටුම්පත මත පදනම්ව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමටත්, යෝජිත පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලබන තෙක් මුදල් රෙගුලාසි සම්පාදනය ආරම්භ කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කිරීම පිණිස භාණ්ඩාගාරයේ ලේකම්ට බලය පැවරීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම

පසුගිය වසර 3ක පමණ කාලයක සිට පවතින ආර්ථික පසුබෑම හේතුවෙන් දේශීය මහා පරිමාණ, මධ්‍ය පරිමාණ හා සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ට තම ව්‍යාපාර පවත්වාගෙන යාම සම්බන්ධයෙන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුව ඇත. මේ වන විට ආර්ථිකය යළිත් යම් ප්‍රමාණයකින් ශක්තිමත් වෙමින් පවතින අතර ඊට අවශ්‍ය මූලික පියවරයන් මහා භාණ්ඩාගාරය විසින් ගනු ලබමින් පවතී. එසේ වුවද, පසුගිය කාලය තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් විසින් තම ව්‍යාපාර කටයුතු සඳහා බැංකු මගින් ලබා ගන්නා ලද ණය මුදල් නැවදුරටත් නිසි පරිදි ගෙවා නිම කිරීම සම්බන්ධයෙන් ගැටලු පවතින බව

විවිධ පාර්ශ්වයන් විසින් පෙන්වා දී ඇත. එම තත්ත්වය යටතේ ණය ගෙවීම පැහැර හැරීම හේතුවෙන් ව්‍යාපාරිකයින්ගෙන් සැලකිය යුතු පිරිසකගේ දේපළ පවත්නා නීතිමය විධිවිධාන අනුගමනය කරමින් බැංකු විසින් පවරාගෙන වෙන්දේසි කිරීමට පියවර ගනිමින් සිටී. ඒ හේතුවෙන් ව්‍යාපාරික ක්ෂේත්‍රයේ පැන නැගිය හැකි අර්බුදකාරී තත්ත්වය සමනය කරමින් බැංකු පද්ධතියට අගතියක් නොවන පරිදි අදාළ ණය ගෙවීම පිණිස යම්කිසි සහන කාලසීමාවක් ලබා දීම යෝග්‍ය බවට පෙනී ගොස් තිබේ. ඒ අනුව, ණය නොගෙවීම හේතුවෙන් බැංකු විසින් ණයකරුවන්ගේ දේපළ අත්පත් කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය 2024-12-15 දින දක්වා තාවකාලික අත්හිටුවීමටත්, ඒ සඳහා අවශ්‍ය නීතිමය විධිවිධාන පැනවීම පිණිස 1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය සංශෝධනය කිරීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********